## අළු බදාදාට පසු බ්‍රහස්පතින්දා

**පළමුවන දේව ප්‍රකාශනය** **ද්විතීය නීති සංග්‍රහය 30: 15–20**

ද්විතීය නීති සංග්‍රහය පොතෙන් ගත් පාඨයෙකි.

*මම අද ඔබ ඉදිරියෙහි ජීවිතය හෝ මරණය ද,*
*ආශිර්වාදය හෝ ශාපය ද තබමි.*

“බලන්න, මම අද ඔබ ඉදිරියෙහි ජීවනය සහ සැපත ද මරණය හා විපත ද තැබීමි. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට මෙදින දෙන පණත් ඔබ අනුගමනය කරන්නහු නම්, ඔබ ඒ රටේ පදිංචි වෙමින්, වැඩි වර්ධනය වී ජීවත් වන්නහු ය. ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ඔබ ප්‍රේම කරමින් දෙවි මග හැසිරෙමින් උන් වහන්සේගේ ආඥා ද නීති හා නියෝග ද ව්‍යවස්ථා ද පිළිපදින්නහු නම් ඔබ අයිති කරගන්නට යන දේශයෙහි දෙවි සමිඳාණන් වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක. එහෙත් ඔබ අකීකරු වී ඔබේ සිත අන් අතකට හැරී ගොස් අනිකුත් දෙවි දේවතාවන්ට වන්දනා නමස්කාර කිරීමට ඔබේ සිත ඇදී ගියොත්, ඔබ නැත්තටම විනාශ වන බවත්, ජෝර්දාන් ගඟෙන් එතෙර වී ඔබ අයිතිකර ගන්නට යන දේශයෙන් ඔබ බොහෝ කල් ජීවත් නොවන බවත් මම අද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමි. මා ඔබ ඉදිරියෙහි ජීවනය හෝ මරණය ද ආශිර්වාදය හෝ ශාපය ද අද තැබූ බවට ඔබට විරුද්ධව සාක්ෂි දරන පිණිස අහසත් පොළොවත් කැඳවමි. එබැවින් ඔබත් ඔබේ පරපුරත් ජීවත් වන පිණිස ජීවනය තෝරා ගන්න. දෙවි සමිඳාණන් වහන්සේ ඔබේ පියවරුන් වන ආබ්‍රහම් ට, ඊසාක් ට සහ ජාකොබ්ට දෙන්නට දිවුළ දේශයෙහි ඔබ පදිංචි වන පිණිස උන් වහන්සේට ප්‍රේම කොට උන් වහන්සේගේ හඬට කීකරු වී උන්වහන්සේට ඇලුම්ව සිටිය යුතුය. එසේ කිරීමෙන් චිරාත් කාලයක් ඔබ ඒ රටේ ජීවත් වන්නහුය.”

දේව වචනය මෙසේ ය.

| පිළිතුරු ගීය | ගීතාවලිය 1: 1–4, 6 |
|---|---|

පිළිතුර: සමිඳාණන් තුළ බලාපොරොත්තුවෙන් ප්‍රීති වන්නෝ භාග්‍යවන්තයෝ ය.

ගීය:

දුදනන් උපදෙස් අනුව නොයන, දෙවිඳුන් ගරහන්නන් ඇසුරු නොකරන, සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන, දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේය.

ඔහු ඇළ දොළ අද්දර සිටුවා ඇති, නියම කලට පල දරන, කොළ පරවී නොයන ගසකට සමාන ය. ඔහු කරන සැම දේ සරුසාර වේ.

පව්ටු දනෝ එසේ නොවෙති. ඔව්හු සුළඟේ යන බොල් හා සමාන වන්නෝය. දැහැමියන් හට සමිඳාණෝ සරණ වන සේක. පව්ටුන්ගේ මාර්ගය විනාශයට යන්නේය.

| සුපුවත් ජය නද |
|---|

මනස්ථාපනය වන්න. ස්වර්ග රාජ්‍යය ආසන්නය.

**සුවිශේෂය** **ලූක් 9: 22–25**

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*මා නිසා සිය ජීවිතය නැතිකර ගන්නා එය රැක ගනියි.*

“තවද, මනුෂ්‍ය පුත්‍රයාණන් බොහෝ දුක් වේදනා විඳින්ටත්, ප්‍රජා මූලිකයන් ද නායක පූජකවරයන් ද විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නට හා මරනු ලබන්නටත් තෙවන දින යළි මරණින් උත්ථාන කරනු ලබන්නටත් නියම ව ඇතැ”යි වදාළ සේක. ජේසුස් වහන්සේ සියල්ලන්ට කතා කොට, “යමෙක් මා අනුව එන්නට කැමැත්තේ ද, ඔහු තමකම නසා, දිනපතා සිය කුරුසිය දරාගෙන මා අනුව ආවා වේ. සිය ජීවිතය රැක ගන්නට කැමැති යමෙක් වේ ද, ඔහු එය නැතිකර ගනියි. මා නිසා සිය ජීවිතය නැති කරගන්නා යමෙක් වේද ඔහු එය රැක ගනියි. යමෙකු මුළු ලෝකය ලබා ගත්තත් සිය ජීවිතය නැතිකර ගතහොත්, නැත්නම් විනාශ කරගත හොත් ඔහුට කුමන ලාභයක් ද?

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.